දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/14/75/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.06.13

**ලේකම්**
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

**<u>2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>හිමිකම් විමර්ශන නිලධාරී/ හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී</u>**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට අනුයුක්තව හිමිකම් විමර්ශන නිලධාරී/ හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී තනතුරෙහි සේවය කරනු ලබන නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව වහාම එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යථෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

04) තවද රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව තිබූ ඇතැම් ස්ථාන මාරු අභියාචනා, වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටුව මගින් විසඳිය හැකිව තිබියදීත්, ඒවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දක්වා ඉදිරිපත්ව තිබීම තුළ වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙතින් අපේක්ෂිත කාර්යභාරය නිසි පරිදි ඉටු කර නොමැති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් විය. ඒ අනුව ඉදිරි වාර්ෂික ස්ථානමාරුවීම් ක්‍රියාවලියේදී, එක් එක් කමිටුව වෙත පැවරෙන වගකීම් නිසි පරිදි ඉටුකරන්නේද යන්න සම්බන්ධව සමීප අධීක්ෂණයක් කරන ලෙස ඔබ වෙත දැනුම් දීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

05) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

06) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

07) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

08) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

09) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**පිටපත -** ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් - කරු. අ.ක.ස හා දැ.ගැ.ස.

18

**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

**වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - 2024**

**හිමිකම් විමර්ශන නිලධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී**

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ජී.ජී.ආර්. ගමගේ මයා | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | මහර | දොම්පෙ | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 2 | සී.එස්. ජයවර්ධන මිය | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | ගලිගමුව | යටිනුවර | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 3 | ජේ.බී.කේ. අජිත් කුමාර මයා | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | මාතර | වැලිගම | ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2024 දෙසැම්බර් මස 31 දින දක්වා කල් දැමීම |
| 4 | එම්.බී.අයි. ඥානසිරි මයා | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | කටාන | - | අභියාචනයට ඉඩ ලබා දෙමින් මිනුවන්ගොඩ කාර්යාලය වෙත ස්ථාන මාරුව ලබා දීම (මිනුවන්ගොඩ කාර්යාලයේ ඩී.පී.සී.එස්. අමරසිංහ මහතාගේ අනුප්‍රාප්තිකයා ලෙස) |
| 5 | ඩබ්.පී.ජේ. උදේනි පොන්සේකා මිය | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | කටාන | මිනුවන්ගොඩ | අභියාචනයට ඉඩ දෙමින් අභියාචකගේ ස්ථාන මාරුව පමණක් අවලංගු කිරීම (අනුප්‍රාප්තික නිලධාරියාගේ ස්ථාන මාරුව ක්‍රියාත්මක වේ) |
| 6 | ආර්.එච්.එන්.එච්. දමයන්ති මිය | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | මිනුවන්ගොඩ | කටාන | ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2024 දෙසැම්බර් මස 31 දින දක්වා කල් දැමීම |
| 7 | ඩබ්.එම්.ජේ. විජේසූරිය මයා | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | කටාන | මිනුවන්ගොඩ | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 8 | කේ.බී.එන්. දිල්හානි මිය | හිමිකම් විමර්ශන නිළධාරී / හිමිකම් පිළිබඳ අතිරේක රෙජිස්ට්‍රාර් සහ සංවර්ධන නිලධාරී | වෙන්නප්පුව | පන්නල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

07/06/2024

06/07